" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED
ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/PTR/2-4/FI/6(E)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2022.04. 21

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.

ප්‍රධාන ලේකම්,
වයඹ/උතුරු මැද/උතුර/නැගෙනහිර/සබරගමුව/ඌව/මධ්‍යම/දකුණු, පළාත

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

**<u>බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් අයුරින් පුරප්පාඩුව පවතින තනතුර සඳහා **සුදුසුකම් සහිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අනු අංකය | තනතුර | ආයතනය | අනුමත ශ්‍රේණිය |
|---|---|---|---|
| 01 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | I ශ්‍රේණිය |

02. **<u>I ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් -</u>**

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකුවීම.
- අයදුම්කරු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2022.05.10 දිනට පූර්වාසන්න වසර 05 තුලදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුලදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
- සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

03. තෝරාගනු ලබන ක්‍රමවේදය -

ඉහත 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙන අතර, එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (අයදුම්පත්‍රය හා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇත.)

04. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

05. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හී සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **2022.05.10 දින හෝ ඊට පෙර applicationptr@gmail.com** දරණ විද්‍යුත් ලිපිනය වෙත යොමු කර, එහි දෘඩ පිටපතක් **2022.05.13 දිනට හෝ ඊට පෙර** " ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට SPEED POST/ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස ද දැනුවත් කරන්නේ නම් මැනවි.

06. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, පත් කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

07. එසේම, යම් නිලධාරියෙකු උක්ත තනතුරක් සඳහා තෝරාගනු ලැබුව හොත් එම නිලධාරියා අදාළ පරිපාලන බලධාරියා වෙතින් බස්නාහිර පළාත් සභාව වෙත නිදහස් කරවා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත මැදිහත් විය නොහැකි බවද සැලකුව මැනවි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම් පත්‍රය

.................................................................... පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ

........................................................................ තනතුර සඳහා අයදුම් කිරීම.

01. මුලකුරු සමග නම -

02. සම්පූර්ණ නම -

03. උපන්දිනය -

04. හැඳුනුම්පත් අංකය -

05. පෞද්ගලික ලිපිනය -

06. දුරකථන අංකය -

07. රාජකාරී ලිපිනය -

08. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය -

09. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ පදනම -

(සාමාන්‍ය සේවක සංඛ්‍යා පදනමද/ විශේෂ සේවක සංඛ්‍යා පදනමද)

09. ශ්‍රී ලං.අ.ප.සේ.II ශ්‍රේණියට උසස් වූ දිනය -

10. ශ්‍රී ලං.අ.ප.සේ.I ශ්‍රේණියට උසස් වූ දිනය -

11. පූර්වාසන්න වසර 05 තුල කාර්යසාධනය -

(ආයතන ප්‍රධානියා විසින් සහතික කල කාර්යය සාධන වාර්තා වල පිටපත් අමුණා එවිය යුතුය.)

| වසර | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| | | | | |

12. (i) වර්තමාන සේවා ස්ථානය -

(ii) දරන තනතුර -

(iii) එම තනතුරට පත්වූ දිනය -

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය -

.................................................

අයදුම්කරුගේ අත්සන

ආයතන ප්‍රධානියාගේ සහතිකය -

............................................................................................. මහතා / මහත්මිය / මෙනවිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව / නොපැවැත්වෙන බව දන්වන අතර, ඔහු / ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා ඉල්ලුම් කර ඇති තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් දැනට සිටින සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව මුදාහැරීමට එකඟ වෙමි / නොවෙමි.

දිනය -

..............................................
අත්සන හා නිල මුද්‍රාව

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය -

ආයතන ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / නොවෙමි.

දිනය -

..............................................
අත්සන හා නිල මුද්‍රාව

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / නොවෙමි.

දිනය -

..............................................
අත්සන හා නිල මුද්‍රාව

**<u>අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය.</u>**

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨතාවය | උපරිම ලකුණු 60 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අවම වසර 03ක සේවා කාලයට අමතරව,<br>සම්පූර්ණ කර ඇති වසර 03ක සක්‍රිය සේවා කාලයට හෝ ඊට වැඩි අමතර සේවා කාලය සඳහා උපරිම ලකුණු ද,<br>සෙසු අයට පහත පරිදි අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.<br>එක් වසරකට - ලකුණු 20<br>මාස 06කට - ලකුණු 10<br>මාස 03කට - ලකුණු 05 | ලකුණු 60 |
| 02 | කුසලතාවය | උපරිම ලකුණු 40 | ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි - ලකුණු12<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 06<br>(අවු. 01 හෝ ඊට වැඩි)<br>ඩිප්ලෝමා - ලකුණු 03<br>(මාස 06ට හෝ ඊට වැඩි)<br>(මූලික පශ්චාත් උපාධියට අමතරව උපරිමය ලකුණු 12ට යටත්ව අධ්‍යාපන හෝ කළමනාරණ සඳහා පමණයි) | ලකුණු 12 |
| | | | ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා, කළමනාකරණ පාඨමාලා, පුහුණු පාඨමාලා (මාස 03ට වැඩි) එක් පාඨමාලාවකට ලකුණු 1 ½ බැගින් (අධ්‍යාපන හෝ කළමනාරණ සඳහා පමණයි) | ලකුණු 03 |
| | | | තොරතුරු තාක්ෂණ පුහුණුව(රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත්)<br>මාස 1 සිට 3 දක්වා, ලකුණු - 02,<br>මාස 3ට වැඩි, ලකුණු - 03 | ලකුණු 03 |
| | | | තමන් විසින් කරන ලද පර්යේෂණ, නිබන්ධන, ග්‍රන්ථ, විෂය ක්ෂේත්‍රයට අදාළ පුවත්පත් ලිපි<br>(පශ්චාත් උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද ඉහත ලේඛනවලට අමතරව ලේඛන ඉදිරිපත් කළ යුතුය) | ලකුණු 03 |
| | | | සේවා ඇගයීම්(පොදු 230බී ආකෘතියේ සඳහන් ඇගයීම් පමණි) | ලකුණු 03 |
| | | | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය/ පෞරුෂත්වය / සන්නිවේදනය | ලකුණු 03 |
| | | | වෙනත් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාවයන් හා ලබා ඇති වෙනත් සුදුසුකම් | ලකුණු 03 |
| | | | කාර්යසාධනය,<br>විශිෂ්ට මට්ටම - ලකුණු 02<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - ලකුණු 1.5<br>සතුටුදායක මට්ටම - ලකුණු 01<br>(කාර්යසාධනයේ ඉහත එක වරණයක් ඇත්නම් පමණක් ලකුණු ලබා දීම සිදුකරනු ලබන අතර,වරණ කිහිපයක් ඇත්නම් කිසිදු ලකුණක් ලබා නොදේ.) | ලකුණු 10 |